පුවත්පත් දැන්වීම.

# කර්මාන්ත අමාත්‍යාංශය

## 2024/2025 වර්ෂ සඳහා අමාත්‍යාංශ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීමයි.

**ප්‍රසම්පාදනයේ අංකය : MI/FIN/32/03/24**

01. කොළඹ 03, ගාලු පාරේ, අංක 73/1 කර්මාන්ත අමාත්‍යාංශ පරිශ්‍රයේ ආපනශාලාව වර්ෂයක කාලසීමාවක් පවත්වාගෙන යාම සඳහා විවෘත මිල ගණන් කැඳවනු ලැබේ.

02. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2024.06.07දින සිට 2024.06.24 දින දක්වා සතියේ දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා අමාත්‍යාංශයේ සරප් වෙත ආපසු නොගෙවනු ලබන රු. 500/-ක මුදලක් ගෙවා ලංසු ලියවිලි ලබා ගත හැක.

03. මේ පිළිබඳ පූර්ව ලංසු සාකච්ඡාව 2024.06.19 දින පෙ. ව. 10.00ට අමාත්‍යාංශ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත .

04. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**2024/2025 වර්ෂ සඳහා අමාත්‍යාංශ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා විවෘත මිල ගණන් කැඳවීම**." යනුවෙන් සඳහන් කළ යුතු අතර මුද්‍රා තබන ලද ලංසු ලේඛන 2024.06.25 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ඉදිරිපත් කිරීමේ වෙලාව අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව
කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.

විමසීම 011-2347392 / 011-2392149 (දිගුව - 309)